www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජූලියන් අසාන්ජ් ජාත්‍යන්තර ව දඩයම් කිරීම

The international witch-hunt of Julian Assange

**2020 ජනවාරි 14**

ලන්ඩනයේ වෙස්ට්මින්ස්ටර් මහේස්ත්‍රාත් උසාවියේ දී විකිලීක්ස් ආරම්භක ජූලියන් අසාන්ජ්ට චෝදනා එල්ල කිරීම, එක්සත් ජනපදයේ, එක්සත් රාජධානියේ, ඕස්ට්‍රේලියාවේ, ස්වීඩනයේ හා ඉක්වදෝරයේ ආන්ඩු මෙන් ම ඒ හා අදාල පුද්ගලයන් ව ද සදාකාලික ව අපකීර්තියට පත්කරන සාධාරනත්වය විකෘත කිරීමකි.

නීතිඥ ගැරෙත් පියර්ස් හට "වෙලුම් ගනනක්" වටිනා සාක්ෂි ලෙස හැඳින්වූ දෙය විමර්ශනය කිරීම සඳහා බෙල්මාෂ් බන්ධනාගාරයේ දී තම සේවාදායකයා හමුවීමට ලබාදුන්නේ පැය දෙකක කාලයක් පමනක් බව, ජනවාරි 13දා උදෑසන අසාන්ජ් සමගින් උසාවියේ පෙනී සිටි අසාන්ජ්ගේ නීතිඥයෝ අනාවරනය කල හ.

බ්‍රිතාන්‍ය පන්ති සාධාරනත්වයේ හුරුපුරුදු නරුමත්වය ප්‍රකාශයට පත්කල දිස්ත්‍රික් විනිසුරු වැනේසා බැරෙයිට්සර්, බන්ධනාගාර විමර්ශන කාමරයේ අවකාශය මඳකම උපුටමින් කියා සිටියේ, මෙය "අසාධාරන අවස්ථාවක්" නො වූ බව යි. එක්සත් ජාතීන්ගේ වාර්තාකරු නිල්ස් මෙල්ට්සර් "වධහිංසා" ලෙස නම් කර ඇති කොන්දේසි යටතේ පෙබරවාරි මාසයේ පිටුවහල් කිරීමේ නඩු විභාගයකට මුහුන දීමට නියමිතව සිටින අසාන්ජ්ව, බැරෙයිට්සර් සිය තට්ටු මිටියේ නාදයත් සමගම නැවත බෙල්මාර්ෂ් හි පිහිටි ඔහුගේ බිම්ගෙහි සිරකුටියට යවා තිබේ.

අසාන්ජ්ගේ දශකයකට ආසන්න ජාත්‍යන්තර දඩයම් කරනු ලැබීමේ මෙම අවධියේ දී, ලෝකයේ වඩාත් ම බලවත් ආන්ඩු පැත්තෙන් එවන් ලජ්ජා විරහිත නිර්නීතිකත්වයක් පෙන්වනු ලැබීම මගින් කිසිවෙකු පුදුමයට පත් නො විය යුතු ය. ව්‍යාජ ලිංගික විෂමාචාර චෝදනා යටතේ විමර්ශනයක් කිරීම පිනිස අසාන්ජ් ව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කිරීමට ස්වීඩන, බ්‍රිතාන්‍ය හා ඇමරිකානු චෝදකයන් 2010 දී කුමන්ත්‍රනය කල තැන් පටන් ම, මෙම "දියුනු ප්‍රජාතන්ත්‍රයන්" ඔවුන්ගේ ම නීති හා සම්ප්‍රදායන් පාගා දමා ඇත්තේ, මධ්‍ය කාලීන සම්මතයන් අනුව පවා අසාධාරන ලෙස සැලකෙන ව්‍යාජ නෛතික ක්‍රියාදාමයකට ජනමාධ්‍යවේදියා ව බඳුන් කරමිනි.

ජනවාරි 13දා සිදුකල සාධාරනත්වය පරිහාසයට ලක් කිරීම, උපදෙස් ලබාගැනීමට අසාන්ජ්ට ඇති අයිතිය මත එල්ල කරන ප්‍රහාරය තීව්‍ර කිරීමකි. එය සිදුවන්නේ, *එල් පායිස්* නමැති ස්පාඤ්ඤ පුවත්පත, යූසී ග්ලෝබල් නම් ආරක්ෂක සංගතයක් අසාන්ජ් ඔහුගේ නීතිඥයන් සමග පැවැත්වූ වරප්‍රසාදිත සාකච්ඡාවන් ගැන රහසේ ඔත්තු බලා, නීති-විරෝධී ලෙස ලබාගත් අවේක්ෂනය සීඅයිඒ සංවිධානය වෙත සපයන ලද්දේ කෙසේදැයි යන්න පිලිබඳ විස්තරාත්මක වාර්තාවක් ප්‍රසිද්ධ කිරීමෙන් පසුව ය. එක්සත් ජනපදය වෙත උදර්පනය කරනු ලැබීමෙන් වැලකීම පිනිස, 2012 සිට 2019 දක්වා අසාන්ජ්ට සරන සෙවීමට බලකෙරුනු ලන්ඩනයේ ඉක්වදෝර තානාපති කාර්යාලය පුරා යූසී ග්ලෝබල් සංගතය ස්ථාපිත කල කැමරාවලින් ලබාගත් වාර්තා ද එම සංගතය විසින් බෙදාහරින ලදී. අසාන්ජ් කතාකල සෑම වචනයක් ම යූසී ග්ලෝබල් විසින් පටිගත කල බව හා එම සාකච්ඡා සීඅයිඒ වෙත සජීවී ව විකාශය කල බව *එල් පායිස්හි* වාර්තා පෙන්වා දුන්නේ ය.

සාපරාධී ලෙස එකඟතාවයෙන් ක්‍රියාකරන මාධ්‍යවල සහයෝගය තිබුන ද අසාන්ජ්ට චෝදනා නැගීම හරහා එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය ආන්ඩු ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ප්‍රගාඪ ප්‍රජාතන්ත්‍ර-විරෝධී පූර්වාදර්ශයන්ගේ වැදගත් කම පහත හෙලීම වඩ වඩා අසීරු වෙමින් පවතී.

ජනවාරි 13දා *හිල්හි* පලකල "සීඅයිඒහි චූදිත දුරාචාරය ජූලියන් අසාන්ජ් නිදහස් කරාවි ද?" යන හිසින් යුත් අදහස් දැක්වීමේ ලිපියක, අසාන්ජ්ගේ වරප්‍රසාදිත නීතිඥ-සේවාදායක සන්නිවේදනයන් ගැන සීඅයිඒ විසින් ඔත්තු බැලීමට එරෙහි ව ඇමරිකානු නීතිඥ ජේම්ස් ගුඩේල් අවඥා සහගත ප්‍රහාරයක් රචනා කලේ ය.

එක්සත් ජනපදය තුල සිටින වඩාත් ම ප්‍රමුඛ හා ගෞරවාදරයට පාත්‍ර වන නීතිඥයන්ගෙන් එක් අයෙක් වන ගුඩේල්, 1971 දී පෙන්ටගන් පත්‍රිකා පලකිරීම හේතුවෙන් නික්සන් පරිපාලනය විසින් *නිව් යෝක් ටයිම්ස්* පත්‍රයට නඩු පැවරූ විට පුවත්පත වෙනුවෙන් පෙනී සිටීම නිසා සුප්‍රකට ය. රෑන්ඩ් සමාගමේ විශ්ලේෂක ඩැනියල් එල්ස්බර්ග් විසින් පෙන්ටගන් පත්‍රිකා කාන්දු කරන ලද අතර, එල්ස්බර්ග් ද අසාන්ජ් හා තොරතුරු හෙලිකරන චෙල්සී මැනිං නිදහස් කරන ලෙස කැඳවුම් කර ඇත.

එක්සත් ජනපද සොල්දාදුවන් 55,000කගේ හා වියට්නාම් වැසියන් මිලියන 3කගේ මරනවලට හේතු වූ වියට්නාම් යුද්ධය ප්‍රසාරනය කිරීමේ දී එක්සත් ජනපද ආන්ඩුව වසර ගනනක් තිස්සේ මහජනයාට බොරු කීවේ කෙසේදැයි පෙන්ටගන් පත්‍රිකා විසින් හෙලිදරවු කලේ ය. මහජන කෝපය පුපුරා යාමක් ජනනය කල එම පත්‍රිකා ප්‍රසිද්ධ කිරීම, යුද-විරෝධී විරෝධතාවන්ට ඉන්ධන සැපයුවේ ය.

ගුඩේල් මෙසේ ලිවී ය: "අපරාධ නඩුවක දී

විශේෂයෙන් ම නීතිඥ-සේවාදායක සාකච්ඡා ප්‍රතිවිරුද්ධ පාර්ශවයට සජීවී ලෙස විකාශය කිරීම ඇතුලු අසීමිත අධිසෝදිසියට ලක් කිරීමට වඩා 'සාධාරනත්වයේ අර්ථයට' එරෙහි ප්‍රහාරයක් තිබිය හැකි ද? අසාන්ජ්ගේ නීතිඥයන්ගේ මූලෝපාය නිරාවරනය කල වුදිත විකාශනය, ඉවත දැමිය නො හැකි වාසියක් ආන්ඩුවට අත් කරදුන්නේ ය. අසාන්ජ්ගේ අධිචෝදනාව පූර්ව-විනිශ්චය සමගින් ඉවත හෙලීමෙන් තොර ව, ආන්ඩුවට සෑම විට ම ආරක්ෂක නීතිඥයන්ට නොමැති වාසියක් තිබෙනු ඇත."

"ඩැනියල් එල්ස්බර්ග් නඩුව උපදේශාත්මක විය හැකි" ගුඩේල් විස්තර කලේ ය.

*ටයිම්ස්* හා *වොෂින්ටන් පෝස්ට්* වෙත ලේඛන කාන්දු කිරීම නිසා එල්ස්බර්ග්ට ද අසාන්ජ්ට මෙන් ම ඔත්තු බැලීමේ පනත යටතේ චෝදනා නගන ලදී. නඩුව සමයේ එල්ස්බර්ග්ගේ මනෝචිකිත්සක වෛද්‍යවරයාගේ කාර්යාලයට කඩාවැදුනු නික්සන්ගේ "පයිප්පකරුවෝ" ඔහුගේ දුරකථනයට රහසේ සවන් දුන් හ. එම නඩුවේ දී, අධිසෝදිසිය "චෝදනාව හානිපූරනය කල නො හැකි ලෙස දූෂ්‍ය කර" තිබුනේ යයි නිගමනය කල විනිසුරු විලියම් මැතිව් බයර්න්, එල්ස්බර්ග් නිදහස් කරමින් චෝදනා ඉවත දැමී ය.

"ඒ හා සමාන හේතූන් මත, අසාන්ජ්ට එරෙහි නඩුව ඉවත දැමිය යුතු" යි ගුඩේල් ලිවී ය.

ඔහු මෙසේ ද සටහන් කලේ යඃ "වරෙන්තු රහිත සෝදිසියකට සාමාන්‍ය ප්‍රතිකර්මය වන්නේ, නීති-විරෝධී ලෙස ලබාගත් තොරතුරු නඩුවෙන් ඉවත් කිරීම වුවත්, එම ප්‍රතිකර්මය මෙහි දී අදාල නො වේ. අසාන්ජ් ව සෝදිසි කිරීම මගින් ආන්ඩුවට ඇති වාසිය ප්‍රත්‍යක්ෂ සාක්ෂි ලබාගැනීම නො ව, අසාන්ජ්ගේ නෛතික මූලෝපායට සූක්ෂම ලෙස ප්‍රවේශ වීමේ වාසිය යි. එබැවින්, අසාන්ජ් සිදුකරන සෑම දෙයක් ම ඔහුගේ විරුද්ධවාදීන් දන්නා නිසා ඔහුට සාධාරන නඩු විභාග යක් දීමේ අවකාශයක් නැත."

එල්ස්බර්ග්ට චෝදනා නැගීම බිඳවැටීමෙන් වසර පනහකට පසුව, මූලික ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කල හැකි කිසිදු කන්ඩායමක් ඇමරිකානු හෝ බ්‍රිතාන්‍ය පාලක පන්තිය තුල නැත.

අනවරත යුද්ධයේ හා මූල්‍ය සමපේක්ෂනයේ දශක තුනක්, අධිරාජ්‍යවාදී කොල්ලකෑමේ විධානයන් වඩා ඉහල මර්දනය හා ලෝක පරිමාන වාරනය ඉල්ලා සිටින මුරකොටු රාජ්‍යයන් විසින් ආරක්ෂා කරන ගෝලීය කතිපයාධිකාරයක වැයික්කිය බවට ධනේශ්වර ලෝකය පරිවර්තනය කර ඇත. එක්සත් ජනපද යුද අපරාධ හෙලිදරවු කරමින් ජාත්‍යන්තර ව සමාජ විරෝධය අනුප්‍රානය කිරීම උදවු දුන් අසාන්ජ් හා මැනිං, මිලියන ගනන් ජනයා මත පටවනු ලැබීමට නියමිත ආඥාදායක පාලන රූප සඳහා පූර්වාදර්ශයන් වෙති.

ඉරානයේ ජනරාල් කසීම් සුලෙයිමානිගේ ඝාතනය සිදුකිරීමට මාස ගනනක් තිස්සේ කුමන්ත්‍රනය කල නිලධාරීන්ගේ හස්තයයේ ම අසාන්ජ් තැබීමට බ්‍රිතාන්‍ය "අධිකරන" පද්ධතිය ක්‍රියාකරමින් සිටීම සියල්ලන්ගේ අයිතීන්ට රුදුරු අන්තරායකි.

ආන්ඩුව එහි විරුද්ධවාදීන් ඝාතනය කරන හා උදර්පනය කරනු ලබන පුද්ගලයා මරා නො දමාවී යයි හෝ වධයන්ට භාජනය නො කරනු ඇතැයි තහවුරු කිරීමට නො හැකි රටකට කිසිදු පුද්ගලයෙක් උදර්පනය කිරීම, සිවිල් හා දේශපාලන අයිතීන් පිලිබඳ ජාත්‍යන්තර සම්මුතිය, මානව හිමිකම් පිලිබඳ යුරෝපා සම්මුතිය හා 2003 බ්‍රිතාන්‍ය උදර්පන පනත විසින් වලක්වනු ලබයි.

එවන් තහවුරුවක් දීමට එක්සත් ජනපදය නෛතික ව අසමත් බව සුලෙයිමානිගේ ඝාතනය අවධාරනය කරයි.

බ්‍රිතාන්‍ය හා එක්සත් ජනපද ආන්ඩුව සිදුකිරීමට උත්සාහ දරමින් සිටින්නේ උදර්පනයක් නො ව, "හිතාමතා ම නිසි ක්‍රියාදාමය මගහැරීම හේතුවෙන් නීතියේ පාලනයට හා (ජිනීවා) සම්මුතිය විසින් ආරක්ෂා කරන වටිනාකම්වලට වහකදුරු වන සාමාන්‍ය නීති පද්ධතියට පිටතින්" කරන රඳවාගැනීමක් වන අත්‍යසාමාන්‍ය කුදලා දීමක් බව, ව්‍යාජ-නෛතික ක්‍රියාදාමය පෙන්වා දෙයි.

ජෙරමි කෝබින්, ඇලෙක්සැන්ඩ්‍රියා ඔකාෂියෝ-කෝර්ටෙස්, බර්නි සැන්ඩර්ස්, ඉලාන් ඕමාර් සහ එක්සත් රාජධානියේ ලේබර් පක්ෂය හා එක්සත් ජනපදයේ ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදීන් සමග හවුල් වී ඇති සියලු දෙනා ඇතුලු අධිරාජ්‍යවාදී දේශපාලන සංස්ථාපිතයේ වාමාංශය යයි හැඳින්වෙන සමස්ත වර්නාවලිය විසින් සාධාරනත්වයේ මෙම විකාරයට පත්වීම නො තකා හැර ඇත.

ඔවුන්ගේ නිශ්ශබ්දතාව අත්වැරැද්දක් නො ව, පන්ති ආස්ථානයකි. මෙම දේශපාලනඥයන් නියෝජනය කරන ධනවත් ඉහල-මධ්‍යම පන්තික ස්ථර, ඔවුන්ගේ දශක ගනන් පැරනි යුද-විරෝධී පුවරු කුනු කූඩයට දමා, එක්සත් ජනපද හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට හුරේ දමන්නන් ලෙස පෙලගැසී ඇත. ලිබියාව හා සිරියාව තුල එක්සත් ජනපදය නායකත්වය දෙන යුද්ධ "මානවීය" සලකා බැලීම් විසින් යුක්ති සහගත කරන්නේ යයි ඔවුන් කරන චිතන්ඩවාදී තර්ක කිරීම්වලට පිටුපසින්, සැබෑ අභිප්‍රේරනයන් රැඳී තිබෙන්නේ, අධිරාජ්‍යවාදී කොල්ලකෑම විසින් විශාලනය කරන ඔවුන්ගේ පිම්බෙන කොටස් වෙලඳපොල ආයෝජනයන් තුල ය.

ජූලියන් අසාන්ජ් හා චෙල්සී මැනිං නිදහස් කරගැනීමේ, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමේ සහ ආඥාදායකත්වය හා යුද්ධය වෙත ගෝලීය ධාවන නැවැත්වීමේ සටනට නායකත්වය දිය හැකි සමාජ බලවේග ඇත්තේ එකක් පමනි. 2019 වසරේ අවසානය, බිලියන ගනනින් ශක්තිමත් හා වඩ වඩා ජාත්‍යන්තර ව අන්තර් සම්බන්ධිත කම්කරු පන්තිය, දශක ගනනාවකින් නො දුටු පරිමානයකින් අරගලයට ඇදී ඒම දැකගත්තේ ය. සමාජවාදීන්ගේ හදිසි කර්තව්‍යය වන්නේ, ලෝකය යුද්ධයෙන් හා ආඥාදායකත්වයෙන් විමුක්ත සමානාතාවේ පදනම මත පරිවර්තනය කිරීම සඳහා මෙම ව්‍යාපාරය විප්ලවීය සමාජවාදී ඉදිරිදර්ශනයකින් සන්නද්ධ කිරීම යි.

**එරික් ලන්ඩන් හා තෝමස් ස්ක්‍රිප්ස්**

© www.wsws.org